**පරීක්ෂණ තොරතුරු පත්‍රිකාව**
**– බාහිර දේශසීමාවේදී සිදුකරන පරීක්ෂණ ගුවන් මඟින් අනවසරයෙන් ඇතුළු වීම**

ඔබ දැනට යුරෝපා සංගමයට අයත් ඉතාලියේ පිහිටි ______________ ගුවන් තොටුපළේ සිටින අතර, ඔබට සහයෝගය දැක්වීමට අප මෙහි සිටින බව දැනුම් දෙන්නෙමු. ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇත්නම් හෝ උපකාර අවශ්‍ය නම්, පසුබට නොවී විමසන්න.

දක්ෂ බලධාරීන් සමඟ නිවැරදිව අදහස් හුවමාරු කර ගැනීම සහතික කිරීම සඳහා පවතින පරිවර්තන සහ සංස්කෘතික මැදිහත්වීම් සේවාවන් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත. එමෙන්ම, ඕනෑම අවස්ථාවක ප්‍රශ්න ඇසීමට සහ පැහැදිලි කිරීම් ලබා ගැනීමට ඔබට හැකියාව ඇත. හැකිතාක් දුරට, පිරිමි හෝ කාන්තා නිලධාරියෙකු සමඟ කතා කිරීමට ඔබට ඉල්ලා සිටිය හැක.

## 1. <u>ඇතුළු වීමේ කොන්දේසි</u>

ඇතුළු වීමේ නීතිරීති ඔබ අනුගමනය කර නොමැති බැවින්, දැනට ඔබ නීත්‍යානුකූලව යුරෝපා සංගමයට ඇතුළත් කර ගෙන නොමැත. එබැවින් බලධාරීන් විසින් "පරීක්ෂණ" ලෙස හැඳින්වෙන පරීක්ෂාවන් සිදු කළ යුතුය. කෙසේ වෙතත්, මෙම ක්‍රියාවලිය අතරතුරදී ජාතික, ජාත්‍යන්තර සහ යුරෝපා සංගම් නීතිය මඟින් සහතික කර ඇති සියලුම අයිතිවාසිකම් සහ බැඳීම් ඔබට අදාළ වේ.

## 2. <u>ස්ක්‍රීනින් (පරීක්ෂා කිරීමේ) ක්‍රියාකාරකම්</u>

ඔබ සිටින ගුවන් තොටුපළේ විවිධ කාර්යාලවලදී මෙම පරීක්ෂණ කටයුතු සිදු විය හැක. පරීක්ෂණ රෙගුලාසිවලට අනුකූලව බලධාරීන් විසින් සිදු කරනු ලබන පියවර පහත පරිදි වේ:

- ආරක්ෂක හේතූන් මත පුද්ගලයා සහ පුද්ගලික දේපල ශාරීරික පරීක්ෂාවට ලක් කිරීම.
- අනන්‍යතාවය තහවුරු කිරීම, පුද්ගලික දත්ත (නම, උපන් දිනය සහ ස්ථානය, පුරවැසිභාවය) එකතු කිරීම, සහ ඔබ සතුව ඇති අනන්‍යතා සහ ගමන් ලියකියවිලි ඉදිරිපත් කිරීම. ලියකියවිලි භාර නොදීම බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු නොකිරීමක් ලෙස සැලකිය හැක.
- ඔබ රාජ්‍ය විරහිත (කිසිදු රටක පුරවැසිභාවයක් නොමැති) තත්ත්වයක පසුවන්නේ නම් ඒ බව දැනුම් දීම.
- ඔබ සමඟ එකට සිටීමට හැකි වන පරිදි, ඔබ සමඟ පැමිණි පවුලේ සාමාජිකයන් සිටී නම් ඒ පිළිබඳව සඳහන් කිරීම.
- ඉතාලියට ඇතුළු වීමට හේතුව ප්‍රකාශ කිරීම.
- ඔබගේ කැමැත්තෙන් තොරව වෙනත් බාහිර පාර්ශවයන්ට ලබා නොදෙමින්, දක්ෂ බලධාරීන් අතර පමණක් පුද්ගලික දත්ත හුවමාරු කර ගැනීම.
- ඇඟිලි සලකුණු ලබා ගැනීම සහ අනන්‍යතා ඡායාරූප ලබා ගැනීම.
- ආරක්ෂක අරමුණු සඳහා ජාතික සහ යුරෝපීය ඩිජිටල් පද්ධති හරහා දත්ත පරීක්ෂා කිරීම.
- ක්‍රියාවලිය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය කාලය සඳහා පමණක් දත්ත එකතු කිරීම සහ සුරක්ෂිතව තබා ගැනීම.
- හදිසි වෛද්‍ය අවශ්‍යතා හෝ සෞඛ්‍යමය හුදෙකලා කිරීම්,විශේෂඥ වෛද්‍ය හෝ මනෝවිද්‍යාත්මක ආධාර ඇගයීම සඳහා වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීම.
- විශේෂිත අවදානම් හෝ අවශ්‍යතා පිළිබඳව ගැඹුරින් සොයා බැලීම සඳහා පුද්ගලික සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ විශේෂ අවදානම් සහගත තත්ත්වයන් වහාම වාර්තා කිරීම.

ඔබ විශේෂිත අවශ්‍යතාවයකින් පෙළෙන තත්ත්වයක සිටී නම්, ඒ බව වහාම බලධාරීන්ට පැවසීම අත්‍යවශ්‍ය වේ. උදාහරණයක් ලෙස: ඔබ වයස අවුරුදු 18 ට අඩු නම්, වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය නම්, ඔබ කාන්තාවක් නම්, ඔබ ලෙස්බියන්, ගේ, ද්විලිංගික, ට්‍රාන්ස්ජෙන්ඩර්, ඉන්ටර්සෙක්ස් නම්, ඔබ ආබාධිත පුද්ගලයෙකු නම්, මනෝවිද්‍යාත්මක සහය අවශ්‍ය නම්, ඔබ වයස්ගත පුද්ගලයෙකු නම්, බාලවයස්කාර දරුවන් සිටින තනි මාපියෙකු නම්, බරපතල රෝගාබාධ හෝ මානසික ආබාධ (පසුකාලීන කම්පන ආතති ආබාධ ) ඇත්නම්, ගැබ්ගෙන ඇත්නම්, වධහිංසා පැමිණවීම්, දූෂණය හෝ වෙනත් බරපතල මානසික, ශාරීරික හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයන්ගෙන් බේරුණු අයෙකු නම් (උදා: ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, කාන්තා ලිංගික අවයව විකෘති කිරීම, ළමා හෝ බලහත්කාර විවාහ, ලිංගික, වාර්ගික හෝ ආගමික හේතු මත සිදු වූ ප්‍රචණ්ඩත්වය), මිනිස් ජාවාරමට ගොදුරු වූවෙකු නම් (ලිංගික, ශ්‍රම හෝ වෙනත් සූරාකෑමක් සඳහා හෝ බලහත්කාරයෙන් විවාහ කර දීමක් සඳහා).

ඔබ වයස අවුරුදු 18 ට අඩු නම්, ඉතාලියේදී ඔබව බාලවයස්කරුවෙකු ලෙස සලකනු ලබන අතර, මෙයින් අදහස් කරන්නේ ඔබේ අවශ්‍යතාවලට සහ වයසට ගැළපෙන පිළිගැනීමක් සහ සහයෝගයක් ඔබට ලැබෙනු ඇති බවයි. තවද, ඔබ දෙමාපියන් හෝ නීත්‍යානුකූලව වගකිව යුතු වැඩිහිටියන් සමඟ නොපැමිණියේ නම්, ඔබේ අයිතිවාසිකම් සහතික කිරීම සඳහා ඔබට උපකාර කරන වැඩිහිටි පුද්ගලයෙකු විසින් ඔබව නියෝජනය කරනු ඇත.

ඔබ පවසන දේ තහවුරු කළ හැකි වෛද්‍ය ලේඛන හෝ සහතික ඔබ සතුව ඇත්නම්, ඒවා හැකි ඉක්මනින් ඉදිරිපත් කරන්න.

- ඔබ, ඔබේ පවුලේ සාමාජිකයන් සහ ඔබේ මව් රටේ සිට ඔබ දැනට සිටින රට දක්වා පැමිණි ගමන පිළිබඳ තොරතුරු එකතු කිරීම.
- පෝරමය අත්සන් කිරීම සහ පෝරමයේ ඇතුළත් කර ඇති තොරතුරු පරීක්ෂා කිරීම, තහවුරු කිරීම හෝ වෙනස් කිරීමට ඉල්ලා සිටීමෙන් පසු එහි පිටපතක් ලබා දී පරීක්ෂණ ක්‍රියාවලිය අවසන් කිරීම.
- බලධාරීන්ට ඉදිරිපත් වී හෝ ගුවන් තොටුපළේදී සොයාගෙන දින තුනක් ඇතුළත පරීක්ෂණ කටයුතු සම්පූර්ණ කිරීම.

මෙම ක්‍රියාවලිය අතරතුර ලබා දෙන සියලුම තොරතුරු රහසිගත වේ: ඒවා මෙම ක්‍රියාවලියට සම්බන්ධ නොවන කිසිදු පුද්ගලයෙකුට කිසිවිටෙකත් හෙළි නොකරනු ඇත.

## 3. <u>පරීක්ෂණ කාලය තුළ අයිතිවාසිකම් සහ යුතුකම්</u>

- පරීක්ෂණ කාලය තුළ ඔබට ආහාර, නවාතැන්, වෛද්‍ය ආධාර (ශාරීරික සහ මානසික) ලැබීමට සහ ඔබේ මූලික අයිතිවාසිකම්වලට ගරු කරමින් ගෞරවාන්විතව සැලකීමට අයිතියක් ඇත.
- ඔබට කිසියම් වෛද්‍යමය ගැටලුවක් ඇත්නම්, මනෝවිද්‍යාත්මක හෝ වෙනත් සහයක් අවශ්‍ය නම්, හෝ ඔබේ මව් රටේදී, සංක්‍රමණයේදී හෝ දේශසීමා හැරයා කිරීමේදී සිදු වූ කිසියම් සිදුවීමක් වාර්තා කිරීමට අවශ්‍ය නම්, ඔබට එය දක්ෂ බලධාරීන්ට හෝ ඔබට සහය වන කාර්ය මණ්ඩලයට පැවසිය හැක.
- නීතිමය උපදෙස් ඇතුළුව, උපදෙස් සහ සහාය ලබා දෙන ඕනෑම පුද්ගලයෙකු හෝ සංවිධානයක් සමඟ සන්නිවේදනය කිරීමට ඔබට අයිතියක් ඇත.
- පරීක්ෂණ ක්‍රියාවලියේදී ඔබේ මූලික අයිතිවාසිකම්වලට ගරු කර නොමැති බව ඔබ සිතන්නේ නම්, දක්ෂ බලධාරීන් වෙත පැමිණිලි කිරීමට ඔබට අයිතියක් ඇත.

- ක්‍රියාවලිය අතරතුර ඔබට පවරා ඇති ස්ථානයේ පරීක්ෂණ බලධාරීන්ට ලබා ගත හැකි පරිදි රැඳී සිටීමටත්, ඉතාලි රාජ්‍ය භූමියට ඇතුළු වීමට සහ රැඳී සිටීමට ඔබට ඇති අයිතිය බලධාරීන් විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටින විට නිවැරදි හා සම්පූර්ණ තොරතුරු ලබා දීමටත් ඔබ බැඳී සිටී.
- ඔබ බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට බැඳී සිටින අතර, විශේෂයෙන්ම පහත සඳහන් දෑ ලබා දීමට බැඳී සිටී:
    - නම, උපන් දිනය, ස්ත්‍රී පුරුෂ භාවය සහ පුරවැසිභාවය;
    - ඔබේ අනන්‍යතාවය තහවුරු කළ හැකි ඔබ සතුව ඇති ලේඛන;
    - අදාළ කාර්ය මණ්ඩලය විසින් එකතු කරනු ලබන ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපයක්.

  ඔබ බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු නොකරන්නේ නම්, පසුව අදාළ වන ක්‍රියා පටිපාටිවලට අදාළව අහිතකර ප්‍රතිඵල ඇති විය හැක.
- ඔබ නොදන්නා සහ/හෝ මතක නොමැති තොරතුරු මොනවාදැයි සඳහන් කරමින්, සම්පූර්ණ සහ නිවැරදි තොරතුරු සැපයීමට ඔබ බැඳී සිටී.

## 4. ජාත්‍යන්තර ආරක්ෂාව ඉල්ලා සිටීමට ඇති අයිතිය

- ඔබේ ජීවිතය සහ/හෝ ඔබේ නිදහස හෝ ඔබේ පවුලේ අයගේ ජීවිතය අනතුරේ පවතින නිසා, නැතහොත් වධහිංසා පැමිණවීම්, බරපතල අනිසි සැලකීම් හෝ අපයෝජනයන්ට බිය වන නිසා ඔබ පුරවැසියෙකු වන රටට (හෝ රාජ්‍ය විරහිත නම්, පුරුදු නේවාසික රටට) ආපසු යාමට බියක් ඇත්නම්, ආරක්ෂාව ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත. ඔබේ ජාතිය, පුරවැසිභාවය, ජනවාර්ගික කණ්ඩායමකට අයත් වීම, ආගම හෝ දේශපාලන මතය නිසා ඔබ පීඩාවට පත් වී ඇත්නම් හෝ පීඩාවට පත්වේ යැයි බියක් ඇත්නම්, හෝ ඔබ යම් සමාජ කණ්ඩායමකට අයත් වන අතර ප්‍රචණ්ඩත්වයට ගොදුරු වේ යැයි හෝ වහල්භාවයට පත් කරනු ඇතැයි බියක් ඇත්නම්, නැතහොත් ඔබට මරණ දණ්ඩනය නියම වේ යැයි, වධහිංසා පැමිණවේ යැයි බියක් ඇත්නම්, හෝ ඔබ යුද කලාපයකින් පැමිණියේ නම්, ඔබට ආරක්ෂාව ඉල්ලා සිටිය හැක.
- ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව (දේශපාලන රැකවරණ)ඉල්ලා සිටීමට කැමති නම්, පරීක්ෂණ ක්‍රියාවලියේදී ඒ බව පැහැදිලිව ප්‍රකාශ කර දක්ෂ බලධාරීන්ට හේතු පැහැදිලි කරන්න.
- ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව ඉල්ලා සිටින්නේ නම්, ඔබේ අවශ්‍යතාවලට ගැළපෙන පිළිගැනීමේ මධ්‍යස්ථානයක් වෙත මාරු කිරීමට ඔබට අයිතියක් ඇත.
- ඔබ පැමිණියේ සහ දැනට සිටින්නේ මෙහි බැවින්, ඔබ ඔබේ අයදුම්පත ඉතාලියේදීම ඉදිරිපත් කළ යුතුය. ඔබේ නඩුව සඳහා වගකිව යුත්තේ කුමන රටද යන්න ඔබට තෝරා ගත නොහැකි නමුත් පවුලේ එකමුතුකමේ අවශ්‍යතා සලකා බලනු ලැබේ.
- ඔබට යුරෝපා සංගමයේ සාමාජික රටක පවුලේ සාමාජිකයන් සිටී නම්, ඒ බව පරීක්ෂණ බලධාරියාට දැනුම් දෙන්න, ඔවුන් සමඟ නීත්‍යානුකූලව නැවත එකතු වීමට ඔබට අයිතියක් තිබේදැයි තක්සේරු කිරීමට එය ප්‍රයෝජනවත් විය හැක.
- ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව ඉල්ලා සිටින්නේ නම්, ඔබ ඉතාලියේ රැඳී සිටිය යුතු අතර බලධාරීන්ගේ අවසරයකින් තොරව වෙනත් යුරෝපා සංගමයේ සාමාජික රටකට යා නොහැක. ඔබේ ජාත්‍යන්තර ආරක්ෂක අයදුම්පත පිළිබඳ තීරණයකට පෙර ඔබ ඉතාලියෙන් පිටව ගියහොත්, එය ඔබේ ක්‍රියාවලියට බලපානු ඇත. මන්ද ආරක්ෂාව ඉල්ලන පුද්ගලයා, අයදුම්පත සඳහා වගකිව යුතු රාජ්‍යය කුමක්ද යන්න පිළිබඳ තීරණය ලැබෙන තෙක් පළමුව බලා සිටිය යුතුය. මෙම තීරණයට පෙර ඔබ වෙනත් රටකට ගියහොත්, බලධාරීන් විසින් මධ්‍යස්ථානයේ ඇති ඔබේ පිළිගැනීමේ පහසුකම් අවලංගු කළ හැක.

- ඉතාලියේ ඔබේ ජාත්‍යන්තර ආරක්ෂක ඉල්ලීම තක්සේරු කිරීම සඳහා විවිධ ක්‍රියා පටිපාටි ඇත: සාමාන්‍ය ක්‍රියා පටිපාටිය , කෙටි කාලයක් ගන්නා කඩිනම් ක්‍රියා පටිපාටිය සහ ඉතාලිය දේශසීමා හෝ සංක්‍රමණ කලාප ලෙස සලකන ස්ථානවල ක්‍රියාත්මක වන ඉතා වේගවත් දේශසීමා කඩිනම් ක්‍රියා පටිපාටිය.
- මෙම විවිධ ක්‍රියා පටිපාටි සහ ඒවායේ කාලසීමාවන් පසුව ඔබට පැහැදිලි කර දෙනු ඇත. මන්දයත් ක්‍රියාවලිය ඉතාලි නීතිය මඟින් තීරණය කරනු ලබන අතර ඔබේ පුද්ගලික තත්ත්වය මත පදනම්ව ඉතාලි බලධාරීන් විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඔබ වයස අවුරුදු 18 ට අඩු නම් සහ දෙමාපියන් හෝ නීත්‍යානුකූලව වගකිව යුතු වැඩිහිටියන් සමඟ නොපැමිණි බාලවයස්කරුවෙකු නම්, බාලවයස්කාරභාවය සඳහා රැඳී සිටීමේ බලපත්‍රයක් නිකුත් කිරීමේ විශේෂිත ක්‍රියාවලියකට ප්‍රවේශ වීමට ඔබට අයිතියක් ඇත.

## 5. ආපසු හැරවා යැවීම

ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව ඉල්ලා නොසිටින්නේ නම් සහ ඇතුළු වීමේ කොන්දේසි සපුරාලන්නේ නැත්නම්, ආපසු හැරවා යැවීමේ තීරණයක් මත පදනම්ව ඔබව ඔබේ මව් රටට හෝ ඔබට ඇතුළු වීමට සහ රැඳී සිටීමට අවසර ඇති වෙනත් රටකට ආපසු හැරවා යැවිය හැක.

## 6. නැවත ස්ථානගත කිරීම

ඔබේ ජාත්‍යන්තර ආරක්ෂක ඉල්ලීම භාර ගැනීමට තීරණය කරන වෙනත් යුරෝපා සංගමයේ සාමාජික රටකට ඔබව මාරු කිරීමටද ඉඩ ඇත. මෙම ක්‍රියාවලිය නැවත ස්ථානගත කිරීම ලෙස හැඳින්වේ.

## 7. අදාළ වන ක්‍රියා පටිපාටිය

පරීක්ෂණ කටයුතු අවසානයේදී, ඔබේ නඩුවට අදාළ වන ක්‍රියා පටිපාටිය මත පදනම්ව, ජාත්‍යන්තර ආරක්ෂාව, ආපසු හැරවා යැවීම හෝ නැවත ස්ථානගත කිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු ඔබට ලැබෙනු ඇත.

## 8. දත්ත ආරක්ෂණය

දත්ත ආරක්ෂණය පිළිබඳ යුරෝපා සංගම් නීති රෙගුලාසි මඟින් ඔබේ පුද්ගලික දත්තවලට ප්‍රවේශ වීමට ඔබට අයිතියක් ලබා දෙන බව මතක තබා ගන්න. එනම්, ඔබ හුවමාරු කරගත් ඔබ පිළිබඳ තොරතුරු බැලීමට, ඒවා නිවැරදි කිරීමට සහ නීතියෙන් නියම කර ඇති ඇතැම් කොන්දේසි යටතේ ක්‍රියාවලිය අතරතුර ලියාපදිංචි කරන ලද ඉතාලි සහ යුරෝපීය දත්ත ගබඩාවලින් ඒවා ඉවත් කිරීමට (මකා දැමීමට) ඉල්ලා සිටීමට ඔබට අයිතිය ඇත.
ඔබට අදාළ වන ක්‍රියා පටිපාටි පිළිබඳව සැමවිටම තොරතුරු ලැබීමට, පැහැදිලි කිරීම් ඉල්ලා සිටීමට සහ ඉතාලියේ ඔබේ ගමන අතරතුර ඔබට හමුවන නිලධාරීන්/ක්‍රියාකරුවන් සමඟ ඕනෑම අවස්ථාවක කතා කිරීමට ඔබට සැමවිටම අයිතිය ඇති බව මතක තබා ගන්න.